
# 18

# අරාබිකරයේ ඉස්ලාම් ව්‍යාප්තිය




ඉස්ලාම් ධර්මය අරාබිකරයට හඳුන්වා දෙනු ලැබී ය. අරාබිකරය බටහිර ආසියාවේ, උතුරට සිරියා කාන්තාරය ද, දකුණට අරාබි මුහුද ද, බටහිරට රතු මුහුද ද, නැගෙනහිරට පර්සියාව ද මායිම් ව පිහිටා ඇත. එම ප්‍රදේශයට ඉස්ලාම් ධර්මය හඳුන්වා දෙනු ලැබූ කාලවකවානුව ජාහිලියියා කාලය යනුවෙන් හැඳින්වෙයි. "ජාහිලියියා" කාලය බුද්ධිය සහ මානුෂිකත්වයෙන් තොර වූ කාලය කි. දේව මග පෙන්වීමට පටහැනි ව ජීවන ක්‍රමය තිබූ කාලය යන අරුත ද එම වදනට ඇත. මේ තත්ත්වය අරාබිකරයේ පමණක් නොව අන් රටවල ද දක්නට ලැබුණේ ය.

## සමාජය

අරාබිකරයේ ගෝත්‍ර ස්වරූපයෙන් යුත් සමාජයක් දක්නට ලැබිණ. පවුල් කිහිපයක් ඒකාබද්ධ වී ශුඌබ් (පොකුර) තැනුණේ ය. මෙම පොකුරු කිහිපයක් ඒකාබද්ධ වී කබීලා (ගෝත්‍ර) විය. මෙම ගෝත්‍රිකයන් "ශෛකු" යන නමින් යුතු නායකයකු විසින් පාලනය කරන ලදි. මේ හැර එහි විධිමත් පාලන ක්‍රමයක් දක්නට තිබුණේ නැත. අරාබිකරයේ භෞතික තත්ත්වය මෙවැනි සමාජ ව්‍යුහයක් ගොඩනැගීමට හේතු වුයේ යැයි කිව හැකි ය.

අරාබිකරයේ සීමිත සම්පත් සහ බහුල අවශ්‍යතා දකින්නට ලැබුණේ ය. ඒවාවන් ඇති කිරීමේ කාර්යයෙහි යෙදුණු ඔවුන්ට තණ කොළවලට සහ ජලයට අඬ දබර වීමට සිදු විය. ඒ සඳහා තමන් ශක්තිමත් චේතනාවෙන් ඔවුහු ගෝත්‍රික ව පෙළ ගැසුණහ. කෑබාව පරිපාලනය කළ කුරෙෂි ගෝත්‍රිකයෝ උසස් කුලයට අයත් වූහ. ඔවුහු වෙළෙඳාම් කටයුතු වල යෙදී සිටියෝ ය.

කාලයක් ගත වී යාමේ දී ගෝත්‍ර සංවිධාන බලවත් හා අන්තවාදී තත්ත්වයකට පත් විය. සෑම පුරවැසියකු ම ගෝත්‍රයක සාමාජිකයෙක් විය. ඔවුහු තම තමන්ගේ ගෝත්‍ර වර්ධනයට කැප වූහ. මෙය "අසබියියා" නොහොත් ගෝත්‍ර හැඟීම් ලෙස හැඳින්වෙයි. සියලු ම අවස්ථාවල ගෝත්‍රයට විශ්වාසනීය ලෙස හැසිරීම පුරුද්දක් විය. එය කඩ කරන අය සමාජයෙන් කොන් වෙති.

එම සමාජයේ ඉතා ම සුළු වරදකට පවා දීර්ඝකාලීන සටන් පැවතුණි. එක්තරා ගෝත්‍රයකට අයත් ඔටුවෙක් තවත් ගෝත්‍රයකට අයත් වත්තක කෑ අතර ඌට පහර දී කකුලක් කැඩීම හේතු කොට ගෙන ඇති වූ "පළූස්" නම් වූ යුද්ධය දීර්ඝ කාලීනව පැවතුණි. යුද්ධ කිරීම සඳහා යුද්ධයට අවැසි හැඟීම් ආරෝපණය පිරිමි අය අවශ්‍ය විය. යුද්ධයට පෙළඹවීමත් පවත්වාගෙන යාමටත්, කිරීමටත් කවියන් අවශ්‍ය විය. එම නිසා පිරිමි ළමුන් හා, කවියන් වෙනුවෙන් උත්සව පැවැත්විණි. පිරිමි ළමුන් කුඩා කාල සිට යුද පුහුණුව ලැබීම අනිවාර්ය විය.

## ආගම

එකල අරාබිකරයේ ජනතාව යහමග යැවීමේ ආගම් කිසිවක් නොතිබුණි. ආගමක් ලෙස ක්‍රියාත්මක වූයේ සංස්කෘතික අංග කිහිපයකි. මක්කමේ එක ම දෙවියන් වන අල්ලාහු තආලා නැමදීමට ඉබ්‍රාහිම් (අලෛ) තුමා විසින් ඉදි කරන ලද කෑබාව තිබුණේ ය. එහෙත් එහි පාරිශුද්ධත්වය කෙලෙසී තිබුණි. එහි බිතුසිතුවම් නිර්මාණය කරන ලදි. පිරිමි සහ ගැහැනු අය නිර්වසත්‍රව (තවාෆ්) යාච්ඤා කළෝ ය. ඔවුහු මුෂ්රික්වරු වශයෙන් ම ජීවත් වූහ. ඔවුන්ගේ දේව භක්තිය ව්‍යාජ විය. අල්ලාහ් දෙවියකු (රබ්බු) වශයෙන් විශ්වාස කළෝ ය. නමුත් ඒක දේව වාදය පිළිගත්තේ නැත.

"අහසේ සිට සහ පොළවේ සිට ඔබට ආහාර සපයන්නේ කවුද? (ඔබගේ) දෘෂ්ඨිය සහ ශ්‍රවණ හැකියාවේ පරම අයිතිකරු කවුද? පණ ඇති (සජීවි) දෙයින් පණ නැති (අජීවි) දෑ පිට කරන්නේ ද (අජීවි) පණ නැති දෙයින් (සජීවි) පණ ඇති දෑ පිට කරන්නේද කවුද? (ලෝකයේ) සියලු දේ විධිමත් ව ක්‍රියා කරවන්නේ කවුද? යනුවෙන් (නබිතුමණි ඔබ) අසන්න. එයට ඔවුහු අල්ලාහ් යනුවෙන් කියයි. එසේ නම් ඔහුට ඔබ බිය විය යුතු නැද්ද ? යනුවෙන් අසන්න," (10:31) යන අල් කුර්ආන් වාක්‍යය මෙය පැහැදිලි කරයි.

ආබ්රහා කෑබාව බිඳීමට පැමිණි විට කෑබාවේ දෙවියෝ එය බලා ගනියි, යන කුරෙෂිවරුන්ගේ හැඟීම මෙයට කදිම නිදසුනකි. මොවුහු දෙවියන් (අල්ලාහ්) ගේ දූතයන් වශයෙන් පහල සිටින කුඩා දෙවියන් පත් කර ගත්හ. මෙය "අප අල්ලාහ් වෙත වඩාත්

සමීපකරවීමට මිස අපි එම දෙවිවරු වන්දනා කළේ නැත" (යනුවෙන් පවසති) (39:3) යනුවෙන් අල් කුර්ආනයේ සඳහන් වේ.

සෑම වසරක් පාසා ම ශුද්ධ වූ මාසවල කඃබාවට බැතිමත්හු පැමිණෙති. එම නිසා ඒ ප්‍රදේශ උත්සවාකාරයෙන් හැඩවුයේ ය. එම කාලය තුළ වෙළෙඳ පොළ පවත්වන ලදි. එහි මල්ලව පොර තරග සහ ගායන තරග පැවැත්විණි. එම තරගවලින් දිනන ගීත කඃබාවේ ප්‍රදර්ශනයට තැබී ය. ගායකයෝ ගෞරවයට පාත්‍ර වූහ. එම නිසා අරාබි භාෂාව සාහිත්‍යමය වශයෙන් සරු විය. එම ගීත හා කවි පසුකාලීන ව ලේඛනගත විය. 'සබ්අ මුඅල්ලකාත්' මේවායින් වැදගත් තැනක් ඉසිලී ය.

## පවුල

පිරිමි හා කාන්තා දෙපාර්ශවය තුළ සමතුලිතතාවක් නොපෙනුණ නිසා විධිමත් පවුල් පරිසරයක් ද නොවී ය. විවාහ කටයුතු පවා අවුල්සහගත තත්ත්වයක තිබුණේ ය. ඉහළ පෙළේ ගෝත්‍රවල "නිකාහ් සාලිහ්" යනුවෙන් ජාතික විවාහ පද්ධතියක් දක්නට ලැබුණේ ය. මෙහි දී කාන්තාවෝ ගෞරවයෙන් සලකනු ලැබූහ.එනමුත් අන් ගෝත්‍රවල විවිධ අයුරින් විවාහය සිදු කිරීම දක්නට ලැබුණේ ය.

පිරිමි පාර්ශවයට බහු භාර්යාවන් සිටි අතරම කාන්තා පාර්ශවයට ද බහු ස්වාමි පුරුෂයෝ සිටියෝය. පියාගේ භාර්යාව ද පියාගේ අභාවයෙන් පසු පුතා විවාහ කර ගත්තේ ය. "මුත්ආ" යනුවෙන් තාවකාලික විවාහ ක්‍රමයක් ද තිබුණේ ය. පියා කවුදැයි මව විසින් හඳුන්වා දෙන ලදි. ස්ථිර වාසස්ථානයක් නොමැති නිසා ඔවුන්ගේ ජීවිතයේ ශිෂ්ට ක්‍රමවේදයක් නොපෙනුණේ ය. එහි දී නොයෙක් අපරාධ සිදු විය. ගෝත්‍ර මුල් කරගෙන ජනතාව තුළ උසස් පහත් භේද දක්නට ලැබුණි. යුද සිරකරුවන් ලෙස අල්ලා ගත් අය සහ මුදල් දී ලබාගත් අය වහලුන් වශයෙන් සැලකුවෝ ය. ඔවුන් හාම්පුතුන්ට උපයා දීමේ ක්‍රමවේදයක් පැවති නමුත් ඔවුන්ට කිසි ම අයිතිවාසිකමක් නොලැබුණේ ය.

තව ද පිරිමි ගැහැනු අතර උසස් පහත් භේදයක් දක්නට ලැබුණේ ය. කාන්තාවන්ට තම අයිතිවාසිකම් බොහොමයක් අහිමි විය. දර රැස් කිරීම, ආහාර පිසීම, ජලය රැගෙන ඒම, කිරිදොවීම, නූල් ගෙතීම, ළමයින් රැකබලා ගැනීම යනාදි වැඩවල ඔවුහු යෙදුනහ. සමහර ගෝත්‍රවල ගැහැනු දරුවන් පණපිටින් වල දැමීමේ පුරුද්දක් ද තිබුණි.

## හැසිරීම

ඝාතනය, මත්ද්‍රව්‍ය, පොළිය, ස්ත්‍රී දූෂණ, පළිගැනීම්, මංකොල්ල වැනි ක්‍රියා මෙහි දී බහුල ව තිබුණි. එනමුත් ඒවා අශෝභන ක්‍රියා ලෙස නොව ගෞරවණීය ක්‍රියා ලෙස සැලකුණේ ය. තම මරණයෙන් පසු සුරා සූදු වැනි පුරුදු නැති අය නැවත විවාහ කර ගන්න එපා යැයි පැවසූ පුවතක් ද තිබුණි. ඉතා ම සුළු පිරිසක් මෙවැනි පාප ක්‍රියාවලින් මිදී සිටියෝ ය. ඒ වගේ ම භාෂා නිපුණත්වය නිදහස් ආකල්ප, පොරොන්දු කඩ නොකිරීම, ආගන්තුක සත්කාර, ධෛර්යය, සරල බව, වැනි ගතිගුණ ද දක්නට ලැබුණේ ය. මේවා පසුකාලීන ව ඉස්ලාමයේ වර්ධනයට රුකුලක් විය. මෙවැනි සමාජයක් තුළ ඉස්ලාමය හඳුන්වා දෙන ලදි. නබි (සල්) තුමා මෙම සමාජය අල්ලාහ්ගේ ප්‍රශංසාවට ලක් වූ සමාජයක් බවට පත් කළේ ය.

**අභ්‍යාස**

1. පහත සඳහන් වචනවල තේරුම ලියන්න.
   I) ජාහිලියියා II) කබීලා III) අසබියියා
   IV) ශෛකු V) මුත්ආ

2. ඉස්ලාමයට පෙර අරාබිකරයේ ගෝත්‍රික ජන සමාජයක් පැවතීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.

3. එකල පිරිමි ළමුන් ඉපදුණේ නම් උත්සව පැවැත්වීම පිළිබඳ හේතු සහගත ව පැහැදිලි කරන්න.

4. එකල ගායකයන්ට ගෞරව දක්වන්න හේතු වූ කරුණු පැහැදිලි කරන්න.

5. එකල අරාබි මිනිසුන්ගේ පැවති යහපත් ගති ගුණ සහ අයහපත් ගති ගුණ වගු ගත කරන්න.